දුරකථන Telephone

කාර්යාලය Office } 0412222681 / 0412222682

උපකුලපති Vice-Chancellor } 0412222683

ලේඛකාධිකාරී Registrar } 0412222998

මූල්‍යාධිකාරී Bursar } 0412222209


මගේ අංකය My No. }

ඔබේ අංකය Your No. }

# රුහුණ විශ්වවිද්‍යාලයය
# UNIVERSITY OF RUHUNA


මාතර.
MATARA, SRI LANKA.


2010-07-01

**කාර්යාලයීය නියෝග අංක 01/2010**

නියෝජ්‍ය උපකුලපති,
සියළුම පීඨාධිපතිවරුන්/පුස්තකාලයාධිකාරී/අධ්‍යක්ෂකවරුන්,
ලේඛකාධිකාරී,
මූල්‍යාධිකාරී,
සියළුම අධ්‍යයනාංශ ප්‍රධානීන්/අංශ ප්‍රධානීන්/ඒකක ප්‍රධානීන් වෙත.

**<u>පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම</u>**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2010/03 හා 2010.06.28 දිනැති චක්‍රලේඛ නියෝගවලට සමගාමීව පහත සඳහන් කාර්යාලීය නියෝග 2010.07.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුය.

01. තම කාර්යාලවල මාසික වැටුප් සහතික කිරීමේදී අංක 2010/03 හා 2010.06.28 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි අදාළ සේවකයින් කටයුතු කර ඇද්ද යන්න පිළිබඳ තහවුරු කර ගැනීමට අධීක්ෂණ නිලධාරීන් වගබලාගත යුතුය.

02. මුල් මාස 03 ඇතුලත ඇඟිලි සලකුණු යන්ත්‍ර හා පැමිණීමේ ලේඛන යන දෙකම ක්‍රියාත්මක වේ. එකී කාලය තුළ ප්‍රථම අවස්ථාවේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයෙහි වේලාව සටහන් කර එකී වේලාව අනුව පැමිණීමේ ලේඛනයේ වේලාව සටහන් කළ යුතුය. ඒ අනුව පැමිණීමේ ලේඛනවල අත්සන් කිරීමට කිසියම් සේවකයෙකු හට අවස්ථාව දීමට පෙර එකී සේවකයින් ඇඟිලි සලකුණු යන්ත්‍රවල වේලාව සටහන් කර ඇති බව අදාල විෂය භාර නිලධාරීන් විසින් තහවුරු කරගැනීම සිය වගකීමක් බව සැලකිය යුතුය.

03. අතිකාල ගණනය කිරීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වේලාවන් පදනම් කරගෙන අතිකාල ගණනය කිරීම කළ යුතුය. ඒ අනුව අතිකාල සේවයේ යෙදීමට අදාළ ගෙවීම් වවුචර නිර්දේශ/අනුමත කරන අධීක්ෂණ නිලධාරීන් එකී වේලාවන් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු කර ඇති බව සනාථ කර ගැනීමට වග බලා ගත යුතුය.

04. වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාල පදනම් කරගන්නේ නම් ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ඇති කාලය සැලකිල්ලට ගැනීමට මූල්‍ය නිලධාරීන් වගබලාගත යුතුය.

05. ක්ෂේත්‍ර රාජකාරී සඳහා යන කාර්යාල නිලධාරීන් ක්ෂේත්‍ර රාජකාරීවලින් පසුව කාර්යාලයෙන් පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ නොහැකි අවස්ථාවල ධාවන සටහන් වැනි වෙනත් වාර්තා මඟින් එම කාලය සනාථ කර ඇති බව අධීක්ෂණ/ගෙවීම් නිලධාරීන් වගබලාගත යුතුය.

01.07.2010

(මහාචාර්ය සුසිරිත් මෙන්ඩිස්)
උපකුලපති
2010.07.01

*jn30--4.docx*